# සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

## හැඳින්වීම

ශ්‍රී ලාංකික ජනතාවගේ තරාතිරම, ආදායම හෝ ඔවුන් ජීවත්වන ප්‍රදේශය නොතකා, විශේෂයෙන්ම සමාන ආදායම් පරාසයක් සහිත අසල්වැසි රටවලට සාපේක්ෂව, නිදහස් සෞඛ්‍ය සේවා සැපයීම තුළින් සෞඛ්‍ය අංශයේ විශිෂ්ට ජයග්‍රහණ අත්කර ගැනීමට ශ්‍රී ලංකාව සමත් වී තිබේ.

රෝහල් මගින් මහජනතාව වෙත වටිනා සේවා සපයනු ලැබුව ද, මහජනයා ඒ බව වටහා නොගනිති. කෙසේ වෙතත්, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, මාසික කාර්ය සාධන සමාලෝචන ඉදිරිපත් කිරීම, අත්පොත් හා මාර්ගෝපදේශ සැකසීම හා ඵලදායිතා වර්ධන වැඩසටහන් ආරම්භ කිරීම ආදිය මගින් ස්වකීය සේවාවල තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා බොහෝ රෝහල් විසින්ම මූලික පියවර ගෙන තිබේ.

විශේෂයෙන්, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවල ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පවත්වා ගෙන යාම හා ඒ පිළිබඳ විධිවිධාන සැලසීමේ දී, වර්තමානයේ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමය ද, එහි සීමිත සම්පත් රාමුව තුළ වැදගත් වෙනස්කමවලට ලක්වෙමින් පවතී.

රෝග නිවාරණයේදී හා රෝගවලට ප්‍රතිකාර කිරීමේදී වඩා යහපත් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සතු වගකීම හඳුනාගැනීමෙන් හා විශේෂ වැඩසටහන් හරහා අදාල ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලාංකිකයන් වෙත ඉහළ ජීවන තත්ත්වයක් ළඟාකර දීම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ ඉලක්කය වේ.

## ගෝලීය තත්ත්වය

පසුගිය දශකයේ වැඩි කාලයක් පුරා, ජාත්‍යන්තර වශයෙන් තමන් වියදම් කරන මුදල හා එය වියදම් කරන ආකාරය පිළිබඳ දැඩි අවධානයක් යොමු කිරීමට සෞඛ්‍ය ආරක්ෂණ සංවිධානවලට සිදු නොවිය. මේ සියල්ල දැන් වෙනස් වී ඇති අතර, මුදල් ඉතිරිකර ගන්නා අතරතුර ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ සඵල කළමනාකරණය තුලනය කිරීමේ ප්‍රවේශය පිළිබඳ අවධානය යොමු කළ යුතුව තිබේ.

මූල්‍ය පීඩනයට පිළියම් යෙදීමේදී ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමෙන් සීමිත නමුත් වැදගත් දායකත්වයක් සිදුවන බවට සාක්ෂි පවතියි. අභියෝග ජය ගැනීමේදීත්, ප්‍රවර්ධනය මැනීම හා අධීක්ෂණයේදීත්, පිරිවැය හා ලාභය සමාලෝචනයේදීත් මෙන්ම කටයුතු ක්‍රියාත්මක කිරීම මනාව කළමනාකරණය කිරීමේදීත් පරිපාලකයින්, සායනික

නිලධාරීන්, හෙදියන් ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් එක්ව කටයුතු කිරීම මගින් ඔවුන්ගේ සාර්ථකත්වය ළඟා කරගැනීමේ හැකියාව වැඩි කර ගත හැකිය.

'යහ පිළිවෙත්' හෝ රීති/පිළිපැදිය යුතු මාර්ගෝපදේශ මගින් පහත කරුණු සඳහා ආරම්භයක් සැලසෙනු ඇත:

- ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා සුරක්ෂිතතාවය අධීක්ෂණය කරන්නන් ගුණාත්මකභාවය ළඟාකර ගැනීමට ක්‍රියාවට නංවන නව සැලසුම් සඳහා කරනු ලබන ආයෝජනවල ප්‍රතිලාභය පිළිබඳ වඩාත් නිශ්චිත විය යුතුය.
- අභිවෘද්ධිය මැනීම හා අභිවෘද්ධිය සඳහා කරනු ලබන ආයෝජනය පැහැදිලි පිරිවැය/ ප්‍රතිලාභ (clear cost/benefit) ආකාරයෙන් ළඟාකර ගන්නා ප්‍රතිඵල හා සම්බන්ධ කිරීම සඳහා වූ ප්‍රවේශයේ දී වඩාත් විදග්ධවීම අවශ්‍ය වේ.
- පිරිවැය අඩු කිරීම අනෙකුත් අංශවලින් වෙන්කළ නොහැකි, ගුණාත්මකභාවයේ හා සුරක්ෂිතතාවයෙහි පැහැදිලි අංගයක් ලෙස පෙනෙන්නට තිබිය යුතුය.
- ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සෑම ව්‍යාපෘතියක් තුළම නාස්තිය අවම කිරීමට, අනවශ්‍ය විචලනය සහ පිරිවැය අවම කිරීමේ ප්‍රකට ඉලක්කයක් අන්තර්ගත විය යුතුය.
- සෑම පිරිවැය අඩු කිරීමේ සැලැස්මක ම ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය වැඩි කිරීමේ හෝ අවම වශයෙන් පාලනය කිරීමේ ප්‍රතිතුලන පියවර කුලකයක් අඩංගු විය යුතුය.

සංවිධානයක් තුළ ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය සඵල ලෙස පාලනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් මැනිය හැකි ප්‍රධාන අභිමතාර්ථ හා පෙනුමක් අත්කර ගැනීමට සෞඛ්‍ය ආරක්ෂණ අංශයට හැකිවනු ඇත්තේ මේ ආකාරයෙන් පමණි.

ගුණාත්මකභාවය හා සුරක්ෂිත රෝගී රැකවරණය ප්‍රමිතියකට අනුකූලව තිරසාර වශයෙන් පවත්වාගෙන යාම සඳහා සෞඛ්‍ය ආරක්ෂණ ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රමිති හා මාර්ගෝපදේශ සැකසීම සඳහා රෝගීන්ගේ සුරක්ෂිතතාව ඉලක්ක කිරීම, කාර්යය මණ්ඩල සම්බන්ධ කර ගැනීම, ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිළිබඳ ඇගයීම හා තක්සේරුව වැඩිදියුණු කිරීම, තොරතුරු හා වාර්තාකරණ පද්ධති වැඩිදියුණු කිරීම හා මුදල් සඳහා වඩාත් හොඳ අගයක් ලබා ගැනීම ද අවශ්‍ය වේ.

සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවය යනු සලකා බැලිය යුතු බොහෝ අංග සහිත සංකල්පයක් වන අතර එය තනි කාර්ය සාධකයකට හෝ සරල පරාමිතියකට ලඝු කළ නොහැක.පසුගිය දශකය තුළ සෞඛ්‍ය ආරක්ෂණය මැනීම හා වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා සහයෝගී ජාත්‍යන්තර ප්‍රයත්න දරා ඇති අතර සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවයේ ඉතා වැදගත් විෂයපථ හා මෙම විෂයපථ ජනප්‍රිය කරවීමට අදාළ පියවර හා දර්ශක පිළිබඳ සහයෝගීතාවක් වර්ධනය වෙමින් පවතියි. මෙම ඉතා වැදගත් විෂයපථ වන්නේ:

- කාර්යක්ෂමතාව
- ප්‍රවේශය හා කාලෝචිත බව
- ධාරිතාව
- සුරක්ෂිතතාව
- රෝගී කේන්ද්‍රතාව
- සාධාරණත්වය

යුරෝපීය රටවල, දකුණු අප්‍රිකාවේ, නෙදර්ලන්තයේ, හංගේරියාවේ, ෆින්ලන්තයේ හා එස්ටෝනියාවේ ගුණාත්මකභාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකසනු ලැබ තිබේ.

සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවයහා සුරක්ෂිතතාව, ගුණාත්මකභාවය සඳහා වූ ජාතික ප්‍රතිපත්ති වැඩසටහන, ගුණාත්මකභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය, ජාතික සෞඛ්‍ය සැලැස්ම, සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වූ ජාතික උපායමාර්ගය හා විශිෂ්ට මට්ටමේ සේවාවක් Quality in the new NHS ආදවිවිධ නම් වලින් ඉහත සඳහන් රටවල සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්ති සකසා තිබේ. නොර්වේ රාජ්‍යයේ ප්‍රතිපත්තිය මගින් පළාත් පාලනය හරහා නෛතික වගවීමක් හා වෘත්තීය ස්වයං නියාමනයක් නියම කරන අතර සඵලදායි ගුණාත්මක ක්‍රම සෑම සෞඛ්‍ය සේවා සපයන්නෙකුම සතුවිය යුතුය.

එම නිසා විවිධ රටවල් වැඩසටහන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආමන්ත්‍රණය කළ යුතු ක්ෂේත්‍ර අනුව ඔවුන්ගේම වූ ප්‍රතිපත්ති සකසා තිබේ. ඇතැම් රටවල් දර්ශක හරහා සිදුකරන ඇගයීම හරියාකාරව ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිල්ලට භාජනය විය යුතු ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කරනු පිණිස නියාමන යාන්ත්‍රණ සකසා තිබේ.

## සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රතිපත්තියට බලපාන ජාතික ප්‍රතිපත්ති

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ ගුණාත්මකභාවයෙහි වැදගත්කම හඳුනාගෙන ඇති අතර, රෝගී පාදක, පෘථුල හා ඉහළ ගුණාත්මක බවකින් යුත් සේවාවක් තුළින් සෞඛ්‍ය ආරක්ෂණයේ විශිෂ්ටත්වය ලබාගත හැකි බව ද දැක්වේ. රජය පෞද්ගලික අංශය සමග එක්ව කටයුතු කරමින් සෞඛ්‍ය සේවා සඳහා සාධාරණ ප්‍රවේශයක් තහවුරු කරනු ඇත.

නිශ්චිත සෞඛ්‍ය අවශ්‍යතා ඉටුකරන්නා වූ, සාධාරණ පදනමක් මත ජනතාවට ප්‍රවේශවිය හැකි සෞඛ්‍ය ආරක්ෂණ සේවයක් සැපයීම, ජනතාව හා සේවා සපයන්නන් දෙපාර්ශවයටම පිළිගත හැකි මට්ටමකට සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම සහ සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ කාර්යක්ෂමතාව හා පිරිවැය ඵලදායීතාවය ඉහල නැංවීම ශ්‍රී ලාංකාවේ ජාතික සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් අවධාරණය කෙරේ.

විශේෂයෙන් දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් සෞඛ්‍ය ආරක්ෂණ සේවය ලබාදීමේ ක්‍රමවේදය ප්‍රතිසංවිධානය කරමින් ගුණාත්මකභාවයෙන් සපිරි රෝගී සත්කාරක සේවයක් සැපයීම රාජ්‍ය සෞඛ්‍ය ප්‍රතිපත්තියේ මූලික ඉලක්කයයි.

ආර්ථිකයේ සියලු අංශ හා සමාජයේ සියලු කොටස්වල සහභාගිත්වය සහිතව ගුණාත්මකභාවය කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවේ ජාතික ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රතිපත්තිය තුළින් බලාපොරොත්තු වේ.

සේවා සැපයීමේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සෞඛ්‍ය පිළිබඳ ප්‍රධාන සැලැස්මේ වැදගත් අංගයකි. සෞඛ්‍ය අංශයේ ආචාරධර්මවලට මධ්‍යගත වන පරිදි ඉහළ ගුණත්වයෙන් යුත් සේවා ලබාදීම සඳහා ගුණාත්මකභාවය සහතික කිරීමේ ක්‍රමෝපායයක් සැකසිය යුතු බව එම සැලැස්මේ දැක්වේ. දැනට පවතින ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් මත ගොඩනැගෙන කණ්ඩායම් හැඟීම හා රෝගී හා පාරිභෝගික කේන්ද්‍රීය බව වැඩි කරන ක්‍රමවත් ආකාරයකින් ගුණාත්මකභාවය සහතික කිරීමේ ක්‍රමවේදයක් සැකසීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය නායකත්වය දෙනු ඇත. මෙම ප්‍රවේශයට සායනික වගකීම, සම වයස් කණ්ඩායම් විමර්ශනය සායනික විගණන මෙන්ම රෝගීන්ගේ තෘප්තිය නියාමනය හා සේවාවල ගුණාත්මකභාවය සම්පූර්ණයෙන්ම කළමනාකරණය ද ඇතුළත් වනු ඇත. වෛද්‍යවරුන්, හෙදියන් ඇතුළු අනෙකුත් සෞඛ්‍ය ආරක්ෂණ අංශයේ සේවකයන් සඳහා නිශ්චිත කාලවලදී අඛණ්ඩ වෘත්තිය අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීමේ අවශ්‍යතාව අදාළ වෘත්තීය හා නියාමන ආයතන සමග සාකච්ඡා කරනු ඇත. එමෙන් ම, රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශයේම ප්‍රමිති පවත්වාගෙන යාම හා වැඩිදියුණු ක්‍රමවේද සඳහා පැහැදිලි ක්‍රමවේද, බලය හා පිළිගැනීම ලබාදීමේ ක්‍රියාවලි හඳුන්වා දෙනු ඇත. ධරණියත්වය සහතික කිරීම සඳහා වෘත්තිය සංවිධාන, වෛද්‍ය පහසුකම් හා සේවා සපයන්නන් සංවර්ධන ක්‍රියාවලියට සහභාගි කරගනු ඇත.

## ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳ ඉතිහාසය

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකභාවය සහතික කිරීමේ ජාතික වැඩසටහනක ආරම්භය 1989 වර්ෂය තෙක් දිවේ. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 1995 වර්ෂයේ දී ජාතික ගුණාත්මකභාවය සහතික කිරීමේ වැඩසටහන පිළිබඳ අත්පොත පළ කිරීමත් සමග තම ආයතනවල ගුණාත්මකභාවය සහතික කිරීමේ වැඩසටහන් හඳුන්වාදීම සඳහා සමහර ආයතන මෙම සංකල්පය වැළඳ ගත්තේය. ඵලදායීතාව තුළින් ගුණාත්මක සෞඛ්‍ය ආරක්ෂණය යන සංකල්පය යටතේ 2000 වර්ෂයේදී ගුණාත්මකභාවය සහතික කිරීමේ වැඩසටහන නැවත දියත් කරනු ලැබීය.

කාසල් වීදියේ කාන්තා රෝහල (ශික්ෂණ) සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගුණාත්මකභාවය සහතික කිරීමේ වැඩසටහනේ කේන්ද්‍රස්ථානය වශයෙන් හඳුනා ගන්නා ලදී. එතැන් පටන් දිවයින පුරා පිහිටි අනෙකුත් රෝහල්වලට ද මෙම වැඩ සටහන ව්‍යාප්ත කිරීමට

පියවර ගෙන තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අම්පාර රජයේ දිස්ත්‍රික් මහ රෝහල, පේරාදෙණිය ශික්ෂණ රෝහල හා කුරුණෑගල පළාත් මහ රෝහල තම ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් අරඹා තිබේ. අනෙකුත් රෝහල්වල පවතින සීමිත පහසුකම් හේතු කොටගෙන ගුණාත්මකභාවය වැඩිදියුණුකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැක්කේ රේඛීය අමාත්‍යාංශවලට අයත් ආයතනවල පමණක් බව විශ්වාස කරනු ලැබීය. 2004 - 2005 වර්ෂවලදී මහියංගනය මූලික රෝහලේ ක්‍රියාත්මක කළ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන මගින් පළාත් සභාව මගින් පාලනය වන රෝහල්වල හා අනෙකුත් කුඩා රෝහල්වල වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මං පෙත් හෙළි කරනු ලැබීය.

මෙම අත්දැකීමත් සමග වයඹ පළාතේ විවිධ පරිපාලන මට්ටම්වලට අයත් රෝහල් පහක නියමු අධ්‍යයනයක් සිදු කරනු ලැබීය. ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මෙමගින් හොඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. මෙම අත්දැකීමත් සමග 2007-2009 කාලය තුළ දකුණු හා ඌව පළාත්වල රෝහල් 8 ක් වෙත වැඩසටහන ව්‍යාප්ත කෙරිනි. ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහනට පහසුකම් සැලසීමට හා එය නියාමනය කිරීම සඳහා දිස්ත්‍රික් ගුණාත්මකභාවය සහතික කිරීමේ ඒකකයක් හා ගුණාත්මකභාවය කළමනාකරණය කිරීමේ ඒකක පිහිටුවීමේ අවශ්‍යතාව මෙම නියමු අධ්‍යයන තුළින් හඳුනා ගන්නා ලදී. එමෙන්ම, සමස්ත දිවයිනේම ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන වෙත පහසුකම් සැලසීම සඳහා අග්‍ර ආයතනයක් පිහිටුවීමට ද නිර්දේශ කෙරිනි. එම නිසා ලෝක බැංකුවේ HSDP අරමුදල් යටතේ ගුණාත්මකභාවය සහතික කිරීමේ ජාතික වැඩසටහන සඳහා ගොඩනැගිල්ලක් ඉදි කෙරිණි. සෞඛ්‍ය ආරක්ෂණ ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ විෂය පථය සහ කාර්යය තීරණය කිරීම සඳහා උපදේශක කමිටුවක් ද පත් කරනු ලැබීය. 2012 වර්ෂයේ අගෝස්තු මාසයේ දී මෙම කමිටුව පත්කරනු ලැබීය. මෙතැන් පටන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන සැලසුම් ගත ආකාරයකට ක්‍රියාතමක කිරීමට පියවර ගන්නා ලදී. මධ්‍යගතව සිදු කරන, දේශියව හසුරුවන, සායනික ලෙස ඉලක්ක ගත, රෝගීන් කේන්ද්‍රීය ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ වැඩසටහන යන මූලධර්මය යටතේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි.

## දැක්ම, මෙහෙවර හා අරමුණ

### දැක්ම

ශ්‍රී ලාංකිය ජනතාවට ප්‍රශස්ත ගුණාත්මකභාවයකින් හා සුරක්ෂිත බවින් යුත් සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයීම.

## මෙහෙවර

ජනතාවගේ අපේක්ෂා ඉටු කරමින්, සියලු පාර්ශවයන්ගේ මැදිහත් වීම තුළින් සෞඛ්‍ය ආරක්ෂණ සුරක්ෂිතතාව තහවුරු කර අඛණ්ඩ වැඩි දියුණු කිරීම් හරහා හැකි උපරිම ගුණාත්මකභාවයකින් යුතු සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයීමට අදාල ආයතනවලට පහසුකම් සැපයීම.

## අරමුණ

ජනතාවගේ සෞඛ්‍ය නොවන අපේක්ෂා ඉටුකරමින්, සායනික ඵලදායිතාවය හා ආරක්ෂාව තහවුරු කරන සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන්හි ගුණාත්මකභාවයෙහි අඛණ්ඩ වැඩි දියුණු කිරීම් සිදු කිරීම.

රජයේ මධ්‍යකාලීන, සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන්හි ගුණාත්මකබව හා සුරක්ෂිත බව පිළිබඳ වූ ප්‍රතිපත්තිය පහත සඳහන් මුඛ්‍ය ක්ෂේත්‍ර ප්‍රතිඵල හත මත පදනම් ව පිහිටුවා ඇත. පැහැදිලි ක්‍රමෝපායයන්ගෙන් සමන්විත මෙම සෑම පරමාර්ථයක්ම තාර්කිකයක් තුළින් බිහි වී ඇත අතර මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය එම තාර්කිකයන් පදනම් කරගෙන සැකසී ඇත. මෙම පරමාර්ථ ළඟා කරගත හැකි ක්‍රමෝපායයන් සුවිශේෂී වැඩ සටහන් හරහා ක්‍රියාවට නංවනු ඇති අතර එම වැඩ සටහන් පිළියෙළ කරනු ලබන්නේ සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන්හි තත්ත්වය හා සුරක්ෂිත බව සම්බන්ධයෙන් වූ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කාර්යය පවරා දී ඇති ක්‍රියාකාරී කණ්ඩායමක් විසිනි. මෙම ක්‍රියාකාරී සැලැස්මේදි ජාතික හා පළාත් පරිපාලකයින් හා රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශයෙහි භූමිකා හා වගකීම් හඳුනාගනු ලැබෙනු ඇත. ප්‍රතිචාරාත්මක, ගුණාත්මක හා සුරක්ෂිත සෞඛ්‍ය ආරක්ෂණ සේවාවක් සාමාන්‍ය ජනතාවට භුක්ති විදීමට සැලැස්වීමට නම් සම්බන්ධීකරණ යාන්ත්‍රණය වැඩිදියුණු කිරීම හා ප්‍රමාණවත් සම්පත් සපයා දීම අත්‍යවශ්‍ය වේ.

## 1 වැනි මුඛ්‍ය ක්ෂේත්‍ර ප්‍රතිඵලය :- පාරිභෝගික / රෝගියාගේ තෘප්තිය

### අරමුණ

පාරිභෝගිකයාගේ වරණයන්, අපේක්ෂාවන් හා වටිනාකම් වලට ගරුකරමින්, පාරිභෝගිකයන් අරමුණු කරගත් ආයතනික වටපිටාවක් තහවුරු කිරීම.

### තාර්කිකය

රෝගයට ප්‍රමාණවත් ලෙස පිළියම් කිරීමත් සමගම, රෝගීන්ට වඩාත් හිතකර වටපිටාවක සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයීම මෑත කාලයේදි අවධානය යොමුව තිබෙන ක්ෂේත්‍රයකි. රෝගී කළමනාකරණයට විශාල ලෙස දායකත්වය ලබා දුන් විද්‍යා හා තාක්ෂණික විෂය ක්ෂේත්‍රයේ ප්‍රගමනයන් අතිමහත්ය. කෙසේ වෙතත් මෙම සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයීමේදි වඩා මානවහිතවාදි, පාරිභෝගිකයා/ රෝගියා කේන්ද්‍ර කරගත් ප්‍රවේශයන්හි අවශ්‍යතාවය ලොව පුරා මතුවෙමින් පවති.

පාරිභෝගික (සෞඛ්‍ය ආරක්ෂණ සේවා භාවිතා කරන්නන්) තෘප්තිය ළඟා කරගැනීම සඳහා නිර්මාණය වී ඇති වැඩ පිළිවෙලවල් ලෙස හඳුන්වනු ලබන අතර දැනට පවතින සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතීන් තුළ දක්නට ලැබෙන මෙම ක්‍රියාවලින් සඳහා විශේෂ අවධානයක් යොමු වී ඇත. ආයතනික චර්යා තුළ ඇතිවන වෙනස්කම්ද, වඩාත් හිතකර පාරිභෝගිකයින් ඉලක්ක කරගත් සේවාවක් සැපයීමට අත්‍යවශ්‍යය.

සායනික වෛද්‍යවරයා හා රෝගියා හා රෝගියාගේ පවුල් අතර හිතකර සම්බන්ධතා ගොඩනගමින් රෝගියාගේ / පාරිභෝගිකයාගේ වටිනාකම් හා වරණයන් වටහා ගැනීම ශක්තිමත් සන්නිවේදනය හා විශ්වාසය මත පදනම්ව පවතී. තමාට සපයන ලද සේවාවන් පිළිබඳව රෝගීන් පවසන අත්දැකීම් තුළින් හුදු සංඛ්‍යාත්මක දත්ත වලට වඩා මහජනයා අපේක්ෂා කරන සේවාවන් පිළිබඳව යම් යම් හෝඩුවාවන් ලබා ගත හැක. රෝගීහු තමා අත්විඳි වඩා හොඳ සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන් පිළිබඳ අත්දැකීම් ඉතා අගයකොට සලකති. පහත දැක්වෙන කරුණු රෝගීන් විසින් ඉතා අගයකොට සළකන බවට අන්තර්ජාතික අධ්‍යයන වලින් තහවුරු වේ. එම කරුණු වන්නේ, තමාට ගෞරවයෙන් හා අභිමානයෙන් යුතුව සැලකීම, සේවා සපයන්නන් කෙරෙහි ඇති විශ්වාසය, කාර්ය මණ්ඩලයේ ආචාරශීලි බව හා සේවාව අවශ්‍ය වූ අවස්තාවෙ සේවාව ලබාගත හැකි වීම, අඛණ්ඩ බව හා අනුවර්තනය, ඒකවරණය සම්බන්ධීකරණය කිරීම, රෝගීන්ගේ වේදනාව අවම කිරීමට සුදුසු පිළියම් යෙදීම හා කායික සුවපහසුව සැලසීම, පාරිභෝගික කැමැත්තට ගරු කිරීම, ඔවුන්ගේ මානසික සුවය ලබා දීමට කටයුතු සැලසීම යන ඒ්වා වේ.

නව සේවාවන්/යාවත්කාලීන ක්‍රියාවලින් සැකසීමේ හා වැඩිදියුණු කිරීමේ අවධීන් වලදී පාරිභෝගික අදහස් විමසීම, අදාල වටිනාකම් පද්ධතියට ඇතුළු කිරීමේදි අතිශය වැදගත් වෙි. තීරණ ගැනීමේදි පාරිභෝගිකයන් සහභාගී කරවා ගැනීම වැඩි දියුණු කිරීම සඳහා

අවශ්‍ය යාන්ත්‍රණ සැකසීම වෙනුවෙන් නොයෙකුත් ක්‍රමෝපායන් ගෙන ඇත. සෞඛ්‍ය පද්ධතියන්හි ඇති අභියෝගය නම් ගුණාත්මක බව වර්ධනය සඳහා ගෙන ඇති සියලු ප්‍රතිපත්තින් හා ක්‍රමෝපායන්හි ප්‍රධාන කරුණු ලෙස රෝගීන් හා මහජනතාව සමග එක්ව කටයුතු කිරීම සැලකීමත් එහි අර්ථාන්විත ක්‍රියාවක් බවට පත් කිරීමත්ය.

රෝගීන් තම සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාවලියේ සම දායකත්වයක් දරන්නන් ලෙස සැලකීමේ වැදගත්කම අවධාරණය කරමින්, සමස්ත සෞඛ්‍ය පද්ධතිය සඳහා රෝගීන් තුළ නියත ප්‍රමුඛස්ථානය රෝගීන්ට හිමිව ඇත. මෙම ක්‍රියාවලීන් සමග සම්බන්ධ කර ගැනීම තුළින් රෝගියාගේ තෘප්තිය වැඩිවන අතරම ඉන් ලැබෙන සෞඛ්‍ය ප්‍රතිලාභ ද අතිමහත්ය. රෝගියා මෙම සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාවලියට සම්බන්ධ කරගැනීම තුළින් සෞඛ්‍ය ආරක්ෂණ හානි ඇතිවීමේ සම්භාවිතාවය අඩු කරගන්නා ආකාරය පිළිබඳව මෑතකදී වැඩි සැළකිල්ලක් දක්වමින් පවතී.

## ක්‍රමෝපායන්

(අ) ප්‍රතිචාරාත්මක / සංග්‍රහශීලි සෞඛ්‍ය ආරක්ෂණ සේවා සැපයීම උදෙසා සේවා සපයන්නා සතු හැකියාව පුළුල් කිරීම.

(ආ) ආරක්ෂණ සේවා සැපයීමෙහි කාලෝචිත බව තහවුරු කිරීම සඳහා යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම.

(ඇ) රෝහල් වල සිටින ආබාධිත, වයස්ගත හා විශේෂ කණ්ඩායම්ද ඇතුළත්ව සියලු රෝගීන්ගේ සෞඛ්‍යමය නොවන අපේක්ෂා ඉටු කිරීමට හේතු වන සංග්‍රහශීලි රැකවරණය සඳහා වූ ප්‍රමිතීන් නියම කිරීම හා පහසුකම් සැලසීම.

(ඇ) ආයතනික ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියට සියලු පාර්ශවයන් සහභාගිකර ගැනීම, ප්‍රවර්ධනය සඳහා යාන්ත්‍රණ සකස් කිරීම.

(ඉ) පාරිභෝගික තෘප්තිය ඇති කිරීම උදෙසා පරීක්ෂණ සිදු කිරීමේ ක්‍රමවේද (Surveillance System) නිර්මාණය කිරීම.

## 2 වැනි මුඛ්‍ය ක්ෂේත්‍ර ප්‍රතිඵලය - කළමනාකරණ පද්ධති හා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම.

### අරමුණ

අඛණ්ඩ ගුණාත්මක වර්ධනයක් උදෙසා ඵලදායි කළමනාකරණ පද්ධති හා ක්‍රියාවලි ඇති කිරීම.

### තාර්කිකය

සෞඛ්‍ය ක්‍රමවේදයන්හි ගුණාත්මකබව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය පිළිබඳ සැලකීමේදී රෙගුලාසි හා ප්‍රමිතීන් දෙස නිතර අවධානය යොමු කරන අතර එය දේශීය මට්ටමේ ප්‍රතිපත්ති අර්ථකථනයන් සඳහා ප්‍රමාණවත් අවකාශයක් සලසා දෙයි. ප්‍රමිතීන් නියම කිරීම හා එම ප්‍රමිතීන් කොතරම් පිළිපදින්නේ දැයි අධීක්ෂණය කිරීම සාධක සමග ඉහළ අනුකූලතාවයක් ඇති කිරීමට පහසුකම් සලසන වඩා ඵලදායි ක්‍රමවේදයන් අතුරින් එකකි.

බොහෝ රජයයන් තම සෞඛ්‍ය අමාත්‍යාංශ තුළම ගුණාත්මකබව පරීක්ෂා කිරීම සඳහා ඒකක ස්ථාපනය කර ඇති අතර එසේත් නැතිනම් බහු නියෝජිත සමාගම් වලින් උපදේශක කණ්ඩායම් කැඳවා ඇත. මෙම කණ්ඩායම් වලින් බොහෝමයක් රජයේ පෙර නියම කරගත් ප්‍රතිසංස්කරණය කළ පරමාර්ථ සඳහා විශේෂයෙන් ස්ථාපනය කළ ඒවා වුවත් අනෙකුත් කණ්ඩායම් සඳහා සවිස්තරාත්මක ස්ථාවර ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමටත් එය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමටත් පැවරී ඇත. මේ සඳහා බොහෝ විට පාරිභෝගිකයා, අලෙවිකරන්නා හා සැපයුම් නියෝජිතයින් ඇතුළත් වේ.

වගකීම් බෙදා ගැනීම, සංවිධානයේ දියුණුව වෙිගවත් කිරීම හා අදාල කළමනාකරණ පද්ධතිවල පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය වැඩි කිරීම තුළින් ගුණාත්මකබව දියුණු කිරීමේ අපේක්ෂාව යථාර්ථයක් බවට පත් කරගත හැක. වගකීම් බෙදා ගැනීම අඛණ්ඩ ගුණාත්මකබව වර්ධනයේ වැදගත් දායකත්වයක් උසුලයි. විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයින්ගේ කණ්ඩායම් එක්ව කටයුතු කිරීම තුළින්, රෝගියාට වඩා වැඩි ප්‍රතිලාභ අත්වේ යැයි යන්න සනාථ වෙමින් පැවතීමෙන් පෙන්නුම් කරන්නේ සෞඛ්‍ය වෘත්තිකයින්ගේ සියලු දෙනාගේ ඒකාබද්ධ සහයෝගය ගුණාත්මකබවෙන් ඉහළ රෝගියා ඉලක්ක කරගත් සේවයක් ලබා දීම සඳහා අත්‍යාවශ්‍ය වන බවයි. සායනික පරිසරය තුළ විවිධ ක්ෂේත්‍රයන්ගේ ඒකතුවෙන් සිදුවන කණ්ඩායම් ක්‍රියාවන් ලෙස වාට්ටු පරීක්ෂාව (Ward Round) නිදසුනක් ලෙස ගත හැක.

සෞඛ්‍ය පද්ධති සැලැස්ම තුළින් සේවාවේ ගුණාත්මකබව ඉහළ නැංවීම උදෙසා විවිධ පාර්ශවයන් සතු වගකීම විස්තර කරයි. මෙහිදි වෘත්තිකයින්, කළමනාකාරීත්වය, සේවාව සඳහා මුදල් ගෙවන්නන්, රාජ්‍ය ආයතන, රෝගීන් හා සමස්ත මහජනතාව වෙත සේවාවේ ගුණාත්මකබව වර්ධනය කිරීම සඳහා නොයෙකුත් භූමිකාවන් හා වගකීම් පැවරිය හැක. කුමන ස්වභාවයකින් යුතු වුවද සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතියක් වුවද, ගුණාත්මකබව ඇති

කිරීම සඳහා දැරිය යුතු වගකීම් බෙදා දිය යුතු අතර අදාල එකඟ වූ ගුණාත්මකබව සම්බන්ධයෙන් වූ නිර්නායක වලට අනුකූල වූ කාර්යය සාධන ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුක්ත විය යුතුය.

ගුණාත්මක බව අධීක්ෂණය කිරීම, මනා ක්‍රියාකාරිත්වයකින් යුතු තොරතුරු යටිතල ව්‍යුහයක් මත පදනම් විය යුතුය. වෙවැනි යටිතල ව්‍යුහයන් පිළිබඳ ජාත්‍යාන්තර අත්දැකීම් ලබාදීම සංකීර්ණ හා වියදම් අධික වැඩපිළිවෙලක් වුවද, එය සිදු කළ නොහැක්කක් නොවේ. සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම පිළිබඳව මහජනයාට තොරතුරු සැපයීම සඳහා බහුල ලෙස භාවිතා වන ඉතා ඵලදායි මෙවලමක් ලෙස අන්තර්ජාලය හැඳින්විය හැක. පිළිගැනීම නැතහොත් අනුමත කිරීම වන (Accreditation) සෞඛ්‍ය ආරක්ෂණ සේවාවේ ගුණාත්මකබව තහවුරු කිරීම සඳහා ඉතා වැදගත් යාන්ත්‍රණයක් ලෙස බොහෝ විට පිළිගනියි. "පිළිගැනීමේ ක්‍රියාවලිය" යනු ගුණාත්මක බව හා සේවාවන්හි උපයෝජනතාවය සම්බන්ධයෙන් සෞඛ්‍ය පහසුකම් කොතරම් මට්ටමකට පෙර නියම කරගත් ඉලක්ක වෙත ළඟා වන්නේ දැයි නිර්ණය කරන විධිමත් ක්‍රියාවලියකි. මෙම ඇගයුම් සාමාන්‍යයෙන් ස්වාධීන පාර්ශවයන් විසින් සිදු කරනු ලැබේ. රටේ පවතින සම්පත් වලට යෝග්‍ය ලෙස පරීක්ෂණ හා පිළිගැනීමේ ක්‍රියාවලිය වෙනස් මට්ටම් වලදී සිදු කෙරේ. මෙවැනි එළඹුමක් තුළින් රෝගියාට ඇතිවන බලපෑම පිළිබඳව සාක්ෂි සුලභ නොවුවත්, මෙවැනි ගුණාත්මකබව සම්බන්ධයෙන් වූ කාර්ය සාධනය පිළිබඳව වූ වාර්තා කිරීම් වෘත්තිකයන්ගේ හා අදාල ආයතන වල කීර්තියට යම් බලපෑමක් ඇති කරන අතර එමගින් ඔවුන්ගේ කාර්ය සාධනය ඉහළ දැමීමට හේතු වේ.

### ක්‍රමෝපායන්

(අ) සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන්හි ගුණාත්මකබව හා සුරක්ෂිතතාව සම්බන්ධයෙන් දේශීය ප්‍රමිතින් ඇති කිරීම.

(ආ) සෞඛ්‍ය ආරක්ෂණ ආයතනයන්හි භාරකාරීත්වය ශක්තිමත් කිරීම.

(ඇ) ගුණාත්මක හා සුරක්ෂිත සෞඛ්‍ය ආරක්ෂණ සංකල්ප හා ආදර්ශයන් යොදාගැනීම හා ක්ෂේත්‍රය තුළ භාවිතයේ ඇති යහ පිළිවෙත් අනුගමනය කිරීම මගින් ද සේවාවේ අඛණ්ඩ ගුණාත්මක වර්ධනයන් තහවුරු කර ගැනීම.

(ඈ) ගුණාත්මක බව වැඩිදියුණු කිරීමේ වැඩ සටහන් වලට සහයවීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) ශක්තිමත් කිරීම.

(ඉ) අන්තර් හා බාහිර පරිසරයේ සිටින සියලු පාර්ශවයන් අතර ක්‍රියාකාරී බව හා වගකිම් බෙදාහදා ගැනීම තුළින් සමස්ත තත්ත්ව කළමනාකරණය කිරීම.

(ඊ) කාර්යසාධන ඇගයුම, ක්‍රමවත් සමාලෝචන හා ප්‍රතිකාරක (corrective) ක්‍රියා සඳහා යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම හා යොදාගැනීම.

(ඌ) යොමු කිරීම, පුහුණු උපදේශන හා සම්පත් හුවමාරුව සඳහා අවශ්‍ය ආයතනික පොකුරු පද්ධතියක් (cluster system) හඳුනා ගනීම හා ස්ථාපිත කිරීම.

(ඍ) ඊට මග පෙන්වීම සඳහා සායනික ප්‍රවීණත්වය හා රෝගීන්ගේ වටිනාකම් වලට අමතරව දැනට පවත්නා නිවැරදිම යහ භාවිතයන් යොදා ගැනීම.

# 3 වැනි ප්‍රමුඛ ක්ෂේත්‍ර ප්‍රතිඵලය - සායනික ඵලදායීතාවය

## අරමුණ

රෝගියාට උපරිම ප්‍රතිලාභයක් සැලසෙන පරිදි සාධක මත පදනම් වූ සදාචාරවත් සායනික ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය.

## තාර්කිකය

සාක්ෂි පාදක භාවිතය (Evidence Based practice) යනු සෞඛ්‍ය ආරක්ෂණය සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී හොඳම සාක්ෂියට අභිමු ලෙස පාලනය කරන ලද අත්හදා බැලීම් වලින් රැස්කරගත් ප්‍රායෝගික සාක්ෂි හා වෙනත් විද්‍යාත්මක ක්‍රමවේදයන්ගෙන් උකහාගත් සාධක ඇතුළත් වේ. මේ සඳහා විස්තරාත්මක හා ගුණාත්මක පර්යේෂණ ක්ෂේත්‍ර වාර්තා තුළින් ලබාගත් තොරතුරු, විද්‍යාත්මක මූලධර්ම හා ප්‍රවීණයන්ගේ අදහස් ඇතුළත් වේ. පර්යේෂණ තුළින් ප්‍රමාණවත් සාධක ගත හැකි නම්, සියලු භාවිතයන් සායනික ප්‍රවීණත්වය හා ආචාරධර්ම සමග පර්යේෂණාත්මක සාධක මත පදනම්ව සිදු කෙරෙනු ලැබේ. යම් සුවිශේෂී ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් සිදුකර ඇති පර්යේෂණ සංඛ්‍යාව ඉහළ නම් එම පර්යේෂණයට ලක්කළ සාධකය, සාධක මත පදනම් වූ භාවිතයින්ට අන්තර්ගත කළ යුතුය. කෙසේ වෙතත් බොහෝ අවස්ථාවලදී පර්යේෂණාත්මක සාධක ප්‍රමාණවත් නොවන නිසා සෞඛ්‍ය ආරක්ෂණ සේවා සම්බන්ධයෙන් තීරණ ගැනීම විද්වතුන්ගේ අදහස් මත හෝ විද්‍යාත්මක මූලධර්මයන් මත පදනම්ව සිදුකෙරේ.

මෑත කාලයේදී මෙම සාක්ෂි මත පදනම් වූ භාවිතයන්, සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන්හි විවිධ අරමුණු සඳහා විවිධ පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන ප්‍රබල මෙවලමක් බවට පත්ව ඇති බව පෙනෙන්නට තිබේ. සායනික ප්‍රතිඵලයන් හි වෙනසවීම් අවම කිරීමට සාධක මත පදනම් වූ සායනික කෙටුම්පත් (protocols) හා නිර්දේශ වැඩිදියුණු කළ හැක. පාරම්පරිකව රෝගියාගේ ආරක්ෂාව පිළිබඳව ගැටලු හඳුනා ගැනීම වෙනත් ක්‍රියාමාර්ගයක් භාවිතය තුළින් රෝගියාගේ ආරක්ෂාව හා රෝගියාට සපයන සේවාවන් හි ගුණාත්මක බව වැඩි කරගත හැකිදැයි පෙන්වීම රෝගියාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සිදු කරන ලද පර්යේෂණ තොරතුරු විශ්ලේෂණය මත පදනම් ව සිදුකෙරේ. රෝගියා රැකබලා ගැනීමේ ගුණාත්මක බව මැනීමට හා වැඩිදියුණු කිරීමට සායනික විගණන වාර්තා උපයෝගී කරගත හැක. සාධක මත පදනම් වූ ආරක්ෂිත ක්‍රම භාවිතයන් ක්‍රියාවට නැංවීම අසීරු අතර එම පද්ධතීන්හි සංකීර්ණ බව, එක් එක් වෛද්‍යවරුන්, ජ්‍යෙෂ්ඨ නායකත්වය හා අවසාන වශයෙන් ගත් කළ සමස්ත සෞඛ්‍ය ආරක්ෂණ සේවා සංස්කෘතික සාධක මත පදනම් වූ ආරක්ෂණ භාවිතයන් සිදුවන පරිසරයක් බවට වෙනස් කිරීම සැබවින්ම අභියෝගයකි.

සාක්ෂි මත පදනම් වූ භාවිතයන් රෝහල් කළමනාකාරීත්වයට හඳුන්වාදීම පැනනගින සදාචාරාත්මක කරුණු තුළින් මෙම මොහොත වන විට වෛද්‍ය විෂය ක්ෂේත්‍රයේ අදාළ අංශයේ ඇතිවෙමින් පවතින ප්‍රධාන වෙනස්කම් විස්තර කිරීමට හැකි වේ. එමෙන්ම මේ තුළින් සාක්ෂි මත පදනම් වූ භාවිතයන්හි සදාචාරාත්මක විශ්ලේෂණයක් කිරීමටත්, එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන ආකාරය නිර්මාණය කිරීමටත් හැකිවේ. සාදාචාරාත්මක වශයෙන් ගැටලු සහගත කරුණු 3ක් මෙසේ විස්තර කළ හැක. එනම්, රෝගීන් සම්බන්ධයෙන් සෞඛ්‍ය ආරක්ෂණ ආයතන විසින්දරනු ලබන වගකීම්, රෝහල් පරිශ්‍රය තුළදී මතුවන සංවිධානාත්මක ගැටලු, සෞඛ්‍ය ආරක්ෂණ සේවා සපයන්නන්ගේ ජනතා මෙහෙවර යනාදියයි. සදාචාරාත්මක සංග්‍රහයන්හි කරුණු විශාල ප්‍රමාණයක් අඩංගු වේ. එම කරුණු වන්නේ ප්‍රතිකාර හා චිකිත්සක කටයුතු සඳහා රෝගියාගේ කැමැත්ත ලබා ගැනීම, උසස් මගපෙන්වීම් භාවිතය, රෝගියාගේ පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය හා රෝගියාගේ සමාජ, අධ්‍යාත්මික හා සංස්කෘතික අවශ්‍යතාවලට ගරුකිරීම යනාදියයි. අරමුණු සඳහා සාධක මත පදනම් වූ ආර්ථික භාවිතයන් ඉහළ යාම හේතු කොටගෙන ඇතිව තිබෙන රෝහල් කළමනාකරණය සම්බන්ධ ආචාර විද්‍යාත්මක අභියෝග හඳුනාගන්නා සහ ආමන්ත්‍රණය කරන ආචාරධර්ම සංග්‍රහයන් ස්ථාපනය කර ගැනීමට මෙය ඉවහල් වනු ඇත.

## ක්‍රමෝපායන්

(අ) සායනික භාවිතයන් පිළිබඳ සාක්ෂි මත පදනම් වූ අඩු වියදම් සායනික ප්‍රොටෝකෝල යන උපදෙස්මාලා සංවර්ධනය සහ ආයතනගත කිරීම.

(ආ) වෘත්තීය මාර්ගෝපදේශනය, සම්යුරු ප්‍රතිනිරීක්ෂණය (peer review) සායනික භාවිතයන් පරික්ෂා කිරීම හා ප්‍රතිපෝෂණ කටයුතු සඳහා යාන්ත්‍රණයන් ස්ථාපනය කිරීම.

(ඇ) තීරණ ගැනීමේදී උපකාරී වීම සඳහා සායනික තොරතුරු කළමනාකරණ ක්‍රමවේදයක් ශක්තිමත් කිරීම.

(ඈ) ආචාර ධර්මානුකූල සායනික භාවිතයන් සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

## 4 වැනි ප්‍රමුඛ ක්ෂේත්‍ර ප්‍රතිඵලය - ආපදා කළමනාකරණය සහ ආරක්ෂාව

### අරමුණ

රෝගීන් හා කාර්ය මණ්ඩලයෙහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ඖෂධ, ක්‍රියාවලින් හා වෙනත් අහිතකර අවස්ථාවලින් ඇතිවන අවදානම අඩුකිරීම.

මහජනතාවට නොමිලේ සෞඛ්‍ය ආරක්ෂණ සේවයක් සැළසීම පිණිස අනුප්‍රාප්තික රජයන් විසින් ඉමහත් දායකත්වයක් දක්වා තිබුණ ද, වැරදි ඖෂධ ලබාදීම්, නුසුදුසු ශල්‍ය / සායනික ක්‍රමවේද සහ නොසැළකිල්ල මත සිදුව ඇති වෛද්‍ය වැරදි සම්බන්ධයන් සලකා බලන කළ දී ආරක්ෂාව සහ සම්බන්ධ වන වෛද්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ ගැටලූ පවතී. එහෙයින්, සෞඛ්‍ය ආරක්ෂණය සැපයීමේදී සමස්ත ආරක්ෂාව තහවුරු කිරීමට හැකි ක්‍රමවේදයන් හඳුන්වාදීමේ අවශ්‍යතාව අවධාරණය කර තිබේ.

මෙවැනි තත්ත්වයක් ඉක්මණින් හඳුනා ගැනීම මගින් කාර්ය මණ්ඩලය අතර දැනුවත්භාවය තහවුරු කරනු ඇති අතරම, ඵලදායී ආපදා කළමනාකරණ ක්‍රමවේදයක් හා වාර්තා කිරීමේ ක්‍රමවේදයන් ස්ථාපනය කිරීම මගින් ඉහළ ප්‍රමිතියෙන් යුතු සත්කාරයක් ලබාදෙන අතරම, රෝගියාගේ ආරක්ෂාවද තහවුරු කරනු ඇත. මෙහි අරමුණ වනුයේ රෝගීන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සංග්‍රහශීලී සහ ආරක්ෂා සහිත සුවකිරීම් පරිසරයක් ලබාදෙන ඒ සඳහා කැපවූ රෝහල් පද්ධතියක් ගොඩනැංවීමයි.

### ක්‍රමෝපායන්

(අ) ඵලදායි ආපදා කළමනාකරණ ක්‍රමවේදයක් තහවුරු කිරීම.

(ආ) අනතුරු සහ අනතුරු සිදුවීමට ආසන්න සිදුවීම් වාර්තා කිරීමේ ඵලදායී ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම.

(ඇ) ආරක්ෂිත සායනික ක්‍රමවේද සහ ක්‍රියාවලීන් සඳහා වන වැඩසටහන් ශක්තිමත් කිරීම.

## 5 වැනි ප්‍රමුඛ ක්ෂේත්‍ර ප්‍රතිඵලය - තත්ත්ව ප්‍රවර්ධන අරමුණු සඳහා සුදුසු සංස්කෘතියක් නිර්මාණය කිරීම

### අරමුණ

සෞඛ්‍ය ප්‍රවර්ධන හා පරිසර හිතකාමී සෞඛ්‍ය ආරක්‍ෂණ සංවිධානයක් පිහිටුවීමේදී, වටිනාකම් බෙදාහදා ගැනීම තහවුරු කිරීම සඳහා ගුණාත්මකභාව ප්‍රවර්ධන උපක්‍රම අන්තර්ගත කිරීම.

### තාර්කිකය

සෞඛ්‍ය ආරක්‍ෂණයේදී තත්ත්ව ප්‍රවර්ධනය සඳහා සෞඛ්‍ය ආරක්‍ෂණ සංස්කෘතිය බලගැන්වීම, පසුගිය දශක දෙක තුළ විශාල අවධානයක් දිනාගත්තකි. යහපත් සංස්කෘතියකින් යුත් සෞඛ්‍ය ආරක්ෂණ සංවිධාන මගින් පොහොසත් සහ බලවත් අයගෙන් ඇහිරී යාමට ඉඩ ඇති, වෙනස් අවශ්‍යතා සහ තෝරාගැනීම් ඇති දිළිඳු ජනයාගේ සහ අනෙකුත් අවාසිදායක තත්ත්වයන් හි සිටින කණ්ඩායම්ද ඇතුළුව, සියලු රෝගීන්ගේ අවශ්‍යතා සපිරේ. සෞඛ්‍ය සේවා විසින් සංස්කෘතික හැකියාව සහ රෝගීන් කේන්ද්‍ර ගතකිරීම ප්‍රවර්ධනය සඳහා පියවර ගතයුතු අතරම, රෝගීන් කෙරෙහි ඇතිවන ප්‍රතිඵල මත කෙරන ඒවාට අනන්‍යවූ හා එකිනෙක ගැටෙන කරුණුවල බලපෑම සොයාබැලිය යුතුය. සෞඛ්‍ය වෘත්තිකයන්ගේ රෝගී කේන්ද්‍රීයත්වය සහ සංස්කෘතික හැකියාව ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපන වැඩසටහන් සංවර්ධනය හා ඇගයීම සඳහා වෛද්‍ය අධ්‍යාපනඥයන්, සමාජ විද්‍යාඥයින්, මානව විද්‍යාඥයින් හා පර්යේෂකයින් සමග හවුල්ව කටයුතු කළ යුතුයි. උසස් තත්ත්වයේ සෞඛ්‍ය රැකවරණය සැපයීමේ මිම්මක් ලෙස සංස්කෘතික හැකියාව ද යොදා ගත යුතුය. එක් කොටසක් ලෙස සංස්කෘතික නිපුනතාවය මැන බැලීමද ඇතුළත් කළ යුතුය. අවසානයේ, සියලු රෝගීන්, රෝගීන්ගේ විවිධ අවශ්‍යතා සහ තෝරාගැනීම් පිළිබිඹු කරන සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයක් නිර්මාණය කිරීම සහ ඇගයුම් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිචාර ලබාදීමට තිබෙන සෑම අවස්ථාවක්ම ප්‍රයෝජනයට ගත යුතුය. (උදා. සමීක්ෂණවලට සහ ඉලක්ක කණ්ඩායම්වලට සහභාගී වීම. )

ගුණාත්මකභාවය සංස්කෘතියේ අරමුණු කරගනිමින් කටයුතු කරන ආයතන, අනවශ්‍ය හා අනුමත කළ නොහැකි වැරදි අවම වශයෙන් සිදු වන ආයතන බවට පත්වීමේ වැඩි ඉඩක් පවතී. මෙවැනි පසුබිමක් සෞඛ්‍ය ආරක්‍ෂණ ආයතනයක ස්ථාපනය කිරීම රෝහල් කාර්යය මණ්ඩලයේ, රෝගීන්ගේ මෙන්ම ප්‍රජාවේ ද සාමූහික ප්‍රයත්නයක් වේ.

ප්‍රමිතිය ඉහළ නැංවීම ව්‍යුහගත ආයතනික කාර්යයක් වන බැවින් ගුණාත්මක ප්‍රවර්ධන කණ්ඩායම් (QIT) සහ කාර්යාභිවර්ධන කණ්ඩායම් (WIT) ස්ථාපනය කිරීම, සෞඛ්‍ය ආරක්‍ෂණ සේවකයන් අතර කණ්ඩායම් හැඟීම ප්‍රවර්ධනය කරයි. මෙමගින් මහජනයා අපේක්‍ෂා කරන ආකාරයේ ගුණාත්මක හා ආරක්ෂා සහිත සෞඛ්‍ය ආරක්‍ෂණ සේ

වයක් සැපයීම සහතික කිරීමේ ප්‍රවර්ධන ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවනු ඇත. මැදිහත්වීම් ප්‍රතිස්ථාපනය කරමින් සහ රෝගීන්ගේ ආරක්ෂාව සහතික කිරීමෙහිලා කාර්යය මණ්ඩලය තව තවත් ශක්තිමත් කරමින් කටයුතු කරන අතරම, ගුණාත්මකභාවය හා ආරක්ෂාව අරමුණු කරගත් උද්යෝගීමත් වතාවරණයක් වැඩිදියුණු කිරීම මගින්, සෞඛ්‍ය ආරක්‍ෂණ ආයතන රෝගීන්ට ආරක්ෂිත ස්ථානයක් බව ක්‍රමක්‍රමයෙන් සහතිකවනු ඇත.

## ක්‍රමෝපායන්

(අ) ගුණාත්මකභාව ප්‍රවර්ධන කණ්ඩායම් (QIT) සහ කාර්යාභිවර්ධන කණ්ඩායම් (WIT) ස්ථාපනය කිරීමෙන් සෞඛ්‍ය ආරක්‍ෂණ ආයතනවල ගුණාත්මකභාවය හා ආරක්ෂාව ලඟාකර ගැනීම.

(ආ) ගුණාත්මකභාවය, කාර්යය මණ්ඩල ආරක්‍ෂාව සහ වෛද්‍ය වැරදි වැළැක්වීම අරමුණු කොටගත් උද්යෝගිමත් පසුබිමක් වර්ධනය කිරීම.

(ඇ) ගුණාත්මකභාවය පිළිබඳ ඉහළ ඇගයුම් ලැබූ සෞඛ්‍ය ආරක්ෂණ ආයතනවල මනා පරිචයන් හුවමාරු කරගන්නා ගුණාත්මකභාවය පිළිබඳ උසස් පසුබිමක් නිර්මාණය කරගැනීම.

(ඈ) සෞඛ්‍ය ආරක්‍ෂණ ආයතනයන්හි අධ්‍යාත්මික සෞඛ්‍ය රැකගැනීම ධෛර්යයමත් කරන යාන්ත්‍රණයක් වර්ධනය කිරීම.

(ඉ) සෞඛ්‍ය පහසුකම් හි සෞඛ්‍ය ප්‍රවර්ධන පසුබිමක් පවත්වාගෙන යාම සඳහා කාර්යය මණ්ඩල රෝගීන් සහ ප්‍රජා සහභාගීත්වය හා ඔවුන් තුළ ඒ පිළිබඳ සංවේදීත්වය ගොඩ නැංවීම.

## 6 වැනි ප්‍රමුඛ ක්ෂේත්‍ර ප්‍රතිඵලය - කාර්යමණ්ඩල සංවර්ධනය හා සුභසාධනය

### අරමුණ

සෞඛ්‍ය ආරක්ෂණයේ ඵලදායිතාව, ප්‍රමිතිය සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම පිණිස නිපුණත්වයෙන් යුත්, නිරෝගී සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් වර්ධනය කිරීම.

### තාර්කිකය

නූතන සෞඛ්‍ය ආරක්‍ෂණය ඉතාමත් සංකීර්ණවූද, ක්ෂණිකව වෙනස්වන පරිසරයක ලබාදෙන්නාවූද සේවයකි. මෙය රෝගියකුට සුදුසු පුද්ගලයා විසින් සුදුසු පරිසරයයේදී යෝග්‍ය සත්කාරය ලබාදෙන්නාවූද අදාළ කාර්යය සඳහා යෝග්‍ය වන්නාවූද, නවීන, නිපුනතාවයෙන් හෙබි සෞඛ්‍ය ශ්‍රම බලකායක් සිටින බව තහවුරු කිරීමේ අභියෝගය මෙම පද්ධතියේ සෑම මට්ටමකටම එල්ල කරයි.

මානව සම්පත යනු ආයතනයක වැදගත්ම සම්පත වෙයි. ලොවපුරා බොහෝ සෞඛ්‍ය ආරක්ෂණ පද්ධති වල මානව සම්පත් කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරෙමින් පවතී. විශේෂයෙන්ම, මානව සම්පත් යනු සෞඛ්‍ය පද්ධතියක ප්‍රධාන සෞඛ්‍ය පද්ධති යෙදවුම් තුනෙන් එකකි. අනෙක් ප්‍රධාන යෙදවුම් දෙක භෞතික ප්‍රාග්ධනය හා පාරිභෝගික / පාරිභෝග්‍ය කාණ්ඩ වේ. පුරවැසියන්ට ඉහළ තත්ත්වයේ සෞඛ්‍ය ආරක්ෂණයක් ලබාදීමට උත්සාහ දැරීමේදී මානව සම්පත් වෘත්තිකයෝ විවිධ ගැටලුවලට මුහුණ දෙති. මේ අතර ප්‍රධාන බාධාවක්ව තිබෙන්නේ අඛණ්ඩ පුහුණු වැඩසටහන් අවම වීම, වෘත්තීය පිවිතයේ ගුණාත්මකභාවය අවම වීම, වෘත්තීය සහයෝගය, සෞඛ්‍ය ආරක්‍ෂණ ආයතනවල කණ්ඩායම් වැඩ අවම වීම ආදී හේතූන්ය.

එම නිසා සෞඛ්‍ය ආරක්ෂණයේ ප්‍රමිතිය හා ආරක්ෂාව ඉහළ නැංවීමේ සියලු ප්‍රතිපත්ති, පරිචයන් හා ක්‍රියාදාමයන්, සෞඛ්‍ය ආරක්‍ෂණයේ ඵලදායිතාව, ප්‍රමිතිය හා ආරක්ෂාව ලඟා කර ගැනීමේ කටයුතුවල සාර්ථකත්වය හා කාර්යක්‍ෂමභාවය ඉහළ නැංවීමට කාර්යණ්ඩලයේ වෘත්තිය කුසලතා දැනුම හා ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් යුතුව සකස්විය යුතුය. සේවකයන් සතුටින් සහ තෘප්තිමත්ව තබා ගැනීම මගින් ඔවුන්ගේ චිත්ත ධෛර්යය සහ අභිප්‍රේරණය තව තවත් ඉහළ නැංවෙන අතර එමගින් සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම්හි සමස්ත ප්‍රගමනයක් කරා ඵලදායි හා කාර්යදායකත්වයක් ලැබෙනු ඇත. ගුණාත්මකභාවය හා රෝගීන්ගේ ආරක්‍ෂාව සම්බන්ධයෙන් වන ක්‍රියාදාම සිදුවන සෑම වෙනසක්ම යම් ආකාරයක පුහුණුවක් හා සම්බන්ධ වනු ඇත. මානව සම්බන්ධතා විධායකයන් ආයතනයක සෑම තලයකම පුද්ගලයින් කාර්යයන් සඳහා යොදවා ගන්නේ කෙසේදැයි දන්නා අතර එම යෙදවීම්, ඕනෑම සමාරම්භකයක සාර්ථකත්වයට ප්‍රධාන සාධකය වන්නේය.

## ක්‍රමෝපායන්

(අ) කාර්යය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය ප්‍රගමනය සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප වලින් කාර්යය මණ්ඩලවලට පහසුකම් සැපයීම.

(ආ) ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හා රෝගීන්ගේ ආරක්ෂාව පිණිස නිර්මාණශිලීත්වය හා නව්‍යකරණයන් ඇති කිරීම සඳහා පාදක වන යාන්ත්‍රණයන් යොදා ගැනීම.

(ඇ) කාර්යය මණ්ඩල යහපැවැත්මට හා වෘත්තීය තෘප්තිමත්භාවය වැඩිදියුණු කිරීමට උපකාරී වන ක්‍රියාකාරකම් සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## 7 වැනි ප්‍රමුඛ ක්ෂේත්‍ර ප්‍රතිඵලය - තත්ත්ව ප්‍රවර්ධනය හා රෝගීන්ගේ ආරක්ෂාව සඳහා පර්යේෂණ

### අරමුණ

තත්ත්වය ප්‍රවර්ධනය හා රෝගීන්ගේ ආරක්ෂාව පිළිබඳ ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

### තාර්කිකය

පර්යේෂණයේ වැදගත්කම වන්නේ, පර්යේෂණ සීමාවෙන් පිටතට ද අදාළ කරගත හැකි දැනුමක් නිර්මාණය කිරීමයි.

පර්යේෂණ, මුළු මහත් ලෝකය පුරාම සැළසුම් සහ වැඩසටහන් සංවර්ධනය පිළිබඳ අඩිතාලම නිර්මාණය කරයි. තවද එමගින් සැලකිල්ලට භාජනය වන විශේෂිත ගැටළු විසඳීම ද සිදුකරයි. ගෝලීය සෞඛ්‍යයේ ප්‍රගමනයට නිතර බාධා කරන ගැටලුවක් වන්නේ පර්යේෂණ, ප්‍රායෝගිකව භාවිතයට පැමිණීමේ මන්දගාමීත්වයයි. බොහෝ විට සාක්ෂි පදනම නිර්මාණය කරන්නන් හා පර්යේෂණවල සොයාගැනීම් ක්‍රියාත්මක කරන්නන් අතර දුර්සම්බන්ධතාවක් පවතී. පර්යේෂණ අධ්‍යයන පල කිරීම, ගෝලීය ප්‍රජාව ඔබගේ පර්යේෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මූලික පියවරක් විය හැකිය. අනෙකුත් ක්‍රියාකාරී පියවරයන්, සාක්ෂි පාදක පරිචයන් පිළිපැදීම ධෛර්යයමත් කිරීම සඳහා යොදාගත හැකිය.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ආරක්ෂණ සංවර්ධන ක්‍රමෝපායන් සළකා බලන කළ, එහි ප්‍රමිතිය හා ආරක්ෂා ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රමුඛ අවධානයක් මෑතකාලීනව දක්වා ඇත. තත්ත්ව ප්‍රවර්ධන හා රෝගීන්ගේ ආරක්ෂාව පිළිබඳ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ, සෞඛ්‍ය ආයතනයන්හි තත්ත්වයෙහි උසස් සෞඛ්‍ය ආරක්ෂණ සේවයේ වර්ධනය කර ගැනීම අරමුණු කරගත් ප්‍රොටෝකෝල නිර්මාණය කර ගැනීම සඳහා වැදගත් වේ. ඒවා ආයතනවලට වඩාත් වැඩිදියුණු කළයුතු දෑ හඳුනාගැනීමට උපකාරි වේ. තවද පර්යේෂණ මගින්, කරන ලද නව වෙනස්කම් තුළින් ක්‍රමවේදයේ පැහැදිලිව දැකිය හැකි වර්ධනයක් තිබේද යන්න සොයා බැලිය හැකි අතරම, එමඟින් මූලික දත්ත හා සංසන්දනය කරමින්, වෙනස්කම් ක්‍රියාත්මක කිරීමෙහි ලද දත්ත ලබා ගැනීමට, විශ්ලේෂණය කිරීමට හා අර්ථ නිරූපනය කිරීමට ද හැකියාව ලැබේ. මෙබඳු පර්යේෂණ මගින් ලබා ගන්නා ලද දැනුම හුවමාරු කර ගැනීම තුළින්, ආයතනයකට, සෞඛ්‍ය ආරක්ෂණය ලබාදීමේ සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමේ කැමැත්ත වැඩිකරන අභිප්‍රේරණීය මනෝභාවයක් ගොඩනැංවිය හැකිය.

## ක්‍රමෝපායන්

(ආ) සාක්ෂි - පාදක කළමනාකරණයක් සඳහා සෞඛ්‍ය ආරක්ෂණයේ ගුණාත්මකභාවය හා ආරක්ෂාව පිළිබඳ පර්යේෂණ හා ප්‍රවර්ධනය.

(ආ) පර්යේෂණ සොයාගැනීම් සහ මනා පරිචයන් ව්‍යාප්ත කිරීම හා භාවිතය.